**නිකවැරටිය ප්‍රාදේශීය සභාව**
**කුරුණෑගල දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 අප්‍රේල් 03 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජූනි 07 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජූලි 25 දින ද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.3,814,412 ක් වූ ගිණුම් විෂයයන් 02 ක් සඳහා විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | තැන්පත් කළ දිනය, විස්තරය, වටිනාකම ඇතුළත් වන ලෙස සැදුම්ලත් ආකාරය දැක්වෙන විස්තරාත්මක උපලේඛන පිළියෙල කළ යුතු වේ. | සභාව මගින් තැන්පත් කළ පුස්තකාල තැන්පත්, මිශ්‍ර තැන්පත් හා යන්ත්‍රෝපකරණ තැන්පත් බව දන්වා සිටිමි. |

**1.4. අනුකූල නොවීම්**

**---------------------**

**නීති, රීති. රෙගුලාසි හා කළමණාකරන තීරණවලට අනුකූල නොවීම්**

**-----------------------------------------------------------------------------**

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව** | **අනුකූල නොවීම** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) <u>1988 ප්‍රාදේශිය සභා (මූල්‍ය හා පරිපාලන) රීති</u> | | | |
| (i) රීති 32-42 | 2018 දෙසැම්බර් 31 දිනට නිකවැරටිය ප්‍රාදේශීය සභාබල ප්‍රදේශයේ මාර්ග 17 කට අයත් දේපල 1175 කින් රු.5,143,430 ක වරිපනම් බදු මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් වලට අදාළ කාල විශ්ලේෂණය පදනම් කරගෙන අයකර ගැනීමේ වැඩසටහන් සඳහා කාල සටහනක් සකස් කර අයකර ගැනීම් වැඩසටහන් අඛන්ඩව ක්‍රියාත්මක කළ යුතු වේ. | කඩිනමින් මෙම හිඟ ආදායම අය කර ගැනීමට කටයුතු කරමි. |
| (ii) 218 රීතිය | සියළුම ඉඩම් ගොඩනැගිලි සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | සියළුම ඉඩම් ගොඩනැගිලි ඇතුළත් වන පරිදි සමීක්ෂණ කටයුතු නිවැරදිව සිදුකර ලේඛනගත කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉඩම් සහ ගොඩනැගිලි සම්බන්ධව සමීක්ෂණයක් සිදුකිරීම සඳහා කමිටුවක් පත් කල අතර එමගින් ඉඩම් සහ ගොඩනැගිලි පිළිබඳව දැනට පවතින ඇගයීම අනුව සිදු කරන ලද තාවකාලික තක්සේරුවක් කර මහා සභාවට යොමු කිරීමට කටයුතු කර ඇත. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | තැන්පත් කර වසර 02 ක කාලයක් ඉක්මවූ රු.1,437,821 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මෙය ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

## 02. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.17,408,658 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 21,653,263 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

---------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

-----------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම<br>රු. | බිල්කළ ආදායම<br>රු. | රැස්කළ ආදායම<br>රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය<br>රු. | ඇස්තමේන්තුගත ආදායම<br>රු. | බිල්කළ ආදායම<br>රු. | රැස්කළ ආදායම<br>රු. | දෙසැම්බර් 31දිනට මුළු හිඟය<br>රු. |
| වරිපනම් හා බදු | 7,010,062 | 6,860,062 | 4,372,827 | 4,772,157 | 3,483,000 | 3,778,000 | 3,612,000 | 2,184,000 |
| බදු කුලී | 19,066,000 | 19,066,000 | 16,178,203 | 4,861,492 | 25,401,000 | 21,579,000 | 21,010,000 | 7,083,000 |
| බලපත්‍ර ගාස්තු | 1,212,300 | 1,212,300 | 845,575 | 80,400 | 1,200,000 | 1,327,000 | 1,247,000 | 80000, |
| වෙනත් ආදායම් | 74,394,914 | 74,394,914 | 68,761,436 | 26,616,340 | 76,361,000 | 64,052,000 | 58,615,000 | 28,628,000 |
| එකතුව | 101,683,276 | 101,533,276 | 90,158,041 | 36,330,389 | 106,445,000 | 90,736,000 | 84,484,000 | 37,975,000 |

### 2.2.2 වරිපනම් හා බදු
------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට රු. 4,391,398 ක වරිපනම් බදු මුදලක් අයවිය යුතුව පැවතුණි. | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී දේපළ තහනම් කිරීම් මගින් හිඟ අය කර ගැනීමට කටයුතු කරමි. |

### 2.2.3 කුලී
------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට ස්ථිර කඩ කාමර 15 කින් රු.109,695 ක ශේෂයක්ද, පළතුරු කුටි 13 කින් රු.56,075 ක ශේෂයක්ද අයවිය යුතුව තිබුණි. | ප්‍රාදේශීය සභා පනත හා ගිවිසුම් ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ආදායම් පරීක්ෂක මහතුන් දැනුවත් කර ඉදිරියේදී හිඟ අය කර ගැනීමට කටයුතු යොදා ඇත. |
| (ආ) | බස් නැවතුම්පල කඩ කාමර සඳහා 2016 ජනවාරි 25 දින තක්සේරු වාර්තා ලැබීමෙන් පසුවද ගිවිසුම් අත්සන් කර කුලී අය කිරීමට කටයුතු නොකිරීම මත සභාවට රු.1,501,150 ක ආදායමක් අහිමි වී තිබුණි. | තක්සේරු වාර්තා අනුව කුලී අයකිරීමට කටයුතු කළ යුතු වේ. | නිකවැරටිය බස් නැවතුම්පල කඩ කාමර කීපයක් විවෘතව ඇති අතර අනෙක් කඩ කාමර විවෘත කර නොමැත. පරවියන් අපිරිසිදු කිරීම නිසා කඩ විවෘත කිරීමට නොහැකි බව පවසමින් බදු කරුවන් හිඟ මුදල් ගෙවීම පැහැර හරිනු ලබයි. මේ නිසා මෙම ප්‍රශ්නයට මේ වන විට විසඳුමක් සොයමින් පවතින අතර ඉදිරියේදී කඩිනමින් අය කරන බව දන්වමි. |
| (ඇ) | බස් නැවතුම්පල කඩ කාමර සඳහා සමාලෝචිත වර්ෂය අවසානයට කඩ කාමර 18 කින් රු.840,828 ක හිඟ කඩ කුලී මුදලක් අයවිය යුතුව පැවතුණි. | ප්‍රමාද ගාස්තු සමඟ හිඟ මුදල් අයකර ගත යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට පොදු පහසුකම් හා සෞඛ්‍ය මධ්‍යස්ථානයේ කඩ කාමර | ප්‍රාදේශිය සභා පනත/ ගිවිසුම් ප්‍රකාරව හිඟ කුලී අයකර ගැනීමට කටයුතු | පොදු පහසුකම් හා සෞඛ්‍යය මධ්‍යස්ථානයේ කඩ කාමර හතකින් අය කර ගැනීමට ඇති |

| | | |
|---|---|---|
| 07 කින් හිඟ කඩ කුලී රු. 315,250 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කළ යුතු වේ. | හිඟ කඩ කුලී රු 1987 315,250. අංක දරන 15 ප්‍රාදේශීය සභා පනතෙහි ( 1 ) 159වගන්තියට අනුව ක්‍රියා කොට කඩිනමින් අය කර ගැනීමට කටයුතු කරන බව දැනුම් දෙමි. |

**03. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යය සාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය , පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබවිහරණය හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳ නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව මහජනයා වෙනුවෙන් කළ යුතු සේවාවන් වෙනුවෙන් සභාව විසින් අතුරු ව්‍යවස්ථා පනවාගෙන නොතිබුණු අතර සම්මත අතුරු ව්‍යවස්ථා වැළඳගෙන තිබුණි. පළාත් පාලන ආයතනය විසින් කුලී ත්‍රිරෝද රථ ගාල් කිරීම සම්බන්ධ අතුරු ව්‍යවස්ථාවක් සකස් කර පළාත් පාලන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර වසර දෙකක් ගතවී තිබුණද, ඒ සඳහා අනුමැතිය හිමිවී නොතිබුණි. | සභාවේ අවශ්‍යතාවය අනුව අතුරු ව්‍යවස්ථා සකස් කර ගැනීමටත්, පනවා ඇති අතුරු ව්‍යවස්ථා අනුව කටයුතු කිරීමටත් ක්‍රියා කළ යුතු වේ. | ඉදිරියේදී අතුරුව්‍යවස්ථා සකස්කර පනවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව දන්වා සිටිමි. |

**(ආ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව සභාව දැනුවත්ව සිටියද 2018 වර්ෂය සඳහා තිරසර සංවර්ධන ඉලක්ක, දර්ශක | තිරසර සංවර්ධන ඉලක්ක ලඟාකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |

හඳුනාගෙන ඉලක්ක ළඟා කර ගැනීමේ ප්‍රගතිය සමාලෝචනය කර නොතිබුණි.

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2016 අප්‍රේල් 11 දින ආරම්භ කර තිබුණු නිකවැරටිය පොදු පහසුකම් හා සෞඛ්‍ය මධ්‍යස්ථානයේ කඩ කාමර කීමනී ක්‍රමයට ලබාගත් ටෙන්ඩර් කරුවන්ගෙන් ගිවිසුම් අත්සන් කර කුලී අය කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු.929,000 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි. | ගිවිසුම් ප්‍රකාරව කීමනී හා කඩකුලී අයකිරීමට කටයුතු කළ යුතුවේ. | පොදු පහසුකම් හා සෞඛ්‍යය මධ්‍යස්ථානයේ කීමනි ක්‍රමයට ටෙන්ඩර් මගින් ලබා ගත් කඩ කාමරවල සම්පූර්ණ හිඟ මුදල ගෙවා අවසන් නොකිරීම හේතුවෙන් එම කඩ කාමරවල ගිවිසුම් අත්සන් කර ගැනීමට නොහැකි විය. එහෙත් මේ වන විට අය කර ගැනීමට ඇති කඩ කාමර කුලිය කඩ විවෘත කල දිනයේ සිට අය කර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ආ) | පොදු පහසුකම් හා සෞඛ්‍ය මධ්‍යස්ථානයේ ටෙන්ඩර් කර ලබාදී තිබූ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යන බිම් මහළ කඩ කාමර අංක 26, 30, 31 න් හා විවෘත කර නොතිබූ උඩු මහළ අංක 08 කඩ කාමරයෙන් කුලී මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කඩකුලී තක්සේරු කර ගිවිසුම් ප්‍රකාරව කුලී මුදල් අයකළ යුතු වේ. | සෞඛ්‍ය මධ්‍යස්ථානයේ අංක 26, 30, 31 සහ උඩු මහළ අංක 08 කඩ කාමරවල මාසික කුලිය තක්සේරු කර දෙන මෙන් 2018.09.19 දින තක්සේරු දෙපාර්තමේන්තුවට දන්වා ඇති අතර මේ වන තෙක් මාසික කුලිය අප වෙත ලැබී නොමැති බැවින්, කුලිය අය කර ගැනීමට නොහැකිව පවතී. මෙම කඩ කාමරවල මාසික කුලිය හැකිතාක් කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කරන බවත්, කඩ කාමරයේ යතුර භාරගත් දිනයේ සිට කට කුලිය අය කර ගැනීමට කටයුතු කරන බවත් දන්වා සිටිමි. |
| (ඇ) | පොදු පහසුකම් හා සෞඛ්‍ය මධ්‍යස්ථානයේ කිසිදු කුලියක් සභාවට ගෙවා නොමැති බදුකරුවන් තුන් | උප බදු දීම් සම්බන්ධයෙන් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු අතර අදාළ කුලී | කඩ කාමර ටෙන්ඩර් මගින් ලබා ගත් කඩ හිමියන් වෙත ගිවිසුමේ සඳහන් පරිදි කඩ කාමරය අන්සතු කිරීම නොකල යුතු බව පිළිබඳ දැනුවත් |

| | | | |
|---|---|---|---|
| | දෙනෙකු විසින් තම කඩ කාමර උපබදු දී තිබුණි. | අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | කිරීමට කටයුතු කරන අතර කඩ කාමර කුලිය අය කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ඇ) | නිකවැරටිය පොදු වෙළඳපොල ස්ථිර කඩ කාමර 35 ක, තාවකාලික එළවළු කුටි 06 ක හා පලතුරු කුටි 19 ක තක්සේරු වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | කඩකුලී තක්සේරු කර අදාළ අයකිරීම් කළ යුතු වේ. | කඩ කුලී ලේඛනයට අනුව මෙම කඩ කාමරවල මාසික කුලිය අය කර ගනු ලබන අතර කිසිදු ලිපි ගොනුවක නිකවැරටිය පොදු වෙළඳපළ තක්සේරු වාර්තාවක් සොයා ගත නොහැක. |
| (ඉ) | අංක 05 කඩ කාමරයෙන් රු.600,000 ක කීමනී මුදලක් අයවිය යුතුව පැවතුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | බස් නැවතුම්පළ බිම් මහල අංක 05, 06 කඩ කාමර දෙකම එකම බදුකරුවෙකු විසින් ටෙන්ඩර් මඟින් ලබාගෙන ඇත. මුදල් ගෙවීමේ ආර්ථික අපහසුතාවය දන්වා සහන කාලයක් ලබා දෙන ලෙස කළ ඉල්ලීම සළකා බලා මහා සභාව මඟින් 2019 මැයි 31 දක්වා කුලී ලබා දී ඇත. |
| (ඊ) | බස් නැවතුම්පල කඩ කාමර බදු ගත් කුලී මුදල් නොගෙවන බදුකරුවන් 06 ක්, ගිවිසුම් අත්සන් නොකළ බදුකරුවෙක් හා කුලී මුදල් ගෙවන බදු ගැණුම්කරුවන් 03 ක් බදු ගිවිසුම්වලට පටහැනිව තම කඩ කාමර උපබදු දී තිබුණු නමුත් සභාව මේ පිළිබඳව දැනුවත් වී නොතිබුණි. | ලිඛිතව දැනුම්දී දැනුවත් කළ යුතු අතර කාලීනව පරීක්ෂාවක් සිදු කළ යුතුය. අදාළ කඩකුලී අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ගිවිසුමේ වගන්ති 23 අනුව බදු දේපළ උප බදු දීම නොකල යුතු බව පිළිගනිමි. මේ පිළිබඳව බදුකරුවන් දැනුවත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (උ) | නිකවැරටිය පොදු පහසුකම් මධ්‍යස්ථානයේ කඩ කාමර කීමනී ක්‍රමයට ලබාදීමේදී කඩ කාමර 08 කින් රු. 2,224,000 ක කීමනී මුදල් ලැබිය යුතුව පැවතුණි. තවද කීමනී නොගෙවූ ඇතැම් කඩ කාමරවල ව්‍යාපාර කටයුතු ආරම්භ කර ඇති බවද නිරීක්ෂණය විය. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | සෞඛ්‍යය මධ්‍යස්ථානයේ මේ වන විට රු.546750/= ක් වන කී මනි හිඟ ශේෂයක් පවතී. මෙම හිඟ මුදල කඩිනමින් අය කර ගැනීමට අවශ්‍ය කටයුතු කරන බව දන්වා සිටිමි. |

## 3.3 ප්‍රසම්පාදනය

## 3.3.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | මාර්ගෝපදේශ ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |

## 3.3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| රු. 1,699,201 ක් වැයකර නිමකළ ගිරිඋල්ල නැබඩව මාර්ගය තාර දමා සංවර්ධනය කිරීමේදි අදාළ නිර්දේශ මත රු. 169,920 ක රඳවුම් මුදල් ආපසු ගෙවීම සභාවේ ලේකම් හා සභාපති විසින් අනුමත කර තිබුණද 2018 දෙසැම්බර් 12 දින සභාවේ තාක්ෂණ නිලධාරී සමග පරීක්ෂා කිරීමේ දි, මාර්ගය ආරම්භයේ සිට මීටර් 20 දක්වා වූ කොටසක පුපුරා ගැලවී වලවල් ගණනාවක් සෑදී තිබුණි. | රඳවුම් නිදහස් කිරීමට පෙර මාර්ගයේ ප්‍රමාණවත් අඩුපාඩු පවතී නම් ඒවා සකස් කරවා ගත යුතු වේ. | මේ වන විට නිර්මාණ වැඩ අධිකාරී මහතා සමඟ මාර්ගය පරීක්ෂා කර කර්මාන්තය අධීක්ෂණය කර කාර්මික නිලධාරී විසින් ඇස්තමේන්තුවක් සකස්කර ඉදිරි කටයුතු සිදුකරමින් සිටින බව දන්වා සිටිමි. |